සාමාන්‍ය සමය විසිහත්වන ඉරුදින **දේව ප්‍රකාශන** 06-10-13

## පළමුවන කියැවීම

හබකුක් 1:2-3, 2:2-4

හබකුක් දිවැසිවරයාගේ පොතෙන් ගත් කොටසකි.

**" දමිටු අය ඇදහිල්ලෙන් ජීවත් වන්නෝ ය."**

සමිඳාණන් වහන්ස, ඔබ සවන් දෙන තෙක්, සවන් දී බලහත්කාරයෙන් අප මුදන තෙක් මම කොපමණ කල් ඔබට මොරගසම් ද? තාඩන පීඩන හා බලහත්කාරය මා අවටින් ඇත. කලකෝලාහල හා අඬදබර හැම තැන ම ඇත. මෙවැනි හිරිහැර හා නපුරුකම් මට බලා සිටින්නට ඔබ වහන්සේ සලසා ඇත්තේ මන් ද?. සමිඳාණන් වහන්සේ මට මෙසේ පිළිතුරු දුන් සේක: "දර්ශනය ලියන්න; එය කියවන්න පුළුවන් වන පිණිස ගල් පුවරුවල පැහැදිලි ලෙස ලියන්න. එසේ කළ යුත්තේ දර්ශනය නියම කාලය වන තෙක් පමාවන බැවිනි. එහෙත්, එය නිෂ්ඵල නොවී වේගයෙන් ඉටුවනු ඇත. එය නොවරදවා පැමිණෙන්නේ ම ය. අදමිටු අය නොපවතින්නෝය; එහෙත්, දමිටු අය දෙවියන් වහන්සේ කෙරෙහි ඇති ඇදහිල්ලෙන් ජීවත් වන්නෝ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 95:1-2, 6-9

පිළිතුර: දෙවි සමිඳාණන් පවසන දෙයට සවන් දෙන්න.

ගීය: එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු; අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු. තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු; එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු; අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමන්ගේ සෙනඟ ය; එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය. එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!

"පාළුකරයේ මස්සා නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩි කර නොගන්න. එහි දී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝ ය. මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝ ය.

## දෙවන කියැවීම

2 තිමෝති 1:6-8, 13-14

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමාට ලියන ලද දෙවන හසුනෙන් ගත් කොටසකි.

**"ස්වාමීන් වහන්සේ උදෙසා සාක්ෂි දැරීමට ලජ්ජා නොවන්න."**

ඒ නිසා මාගේ හස්තාලේපනය හේතුකොටගෙන ඔබ කෙරෙහි තිබෙන දෙවියන් වහන්සේගේ දීමනාව ගිනි දල්ලක් සේ දල්වාගන්නා ලෙස ඔබට සිහි කරවමි. දෙවියන් වහන්සේ අපට දුන්නේ, බයාදු ගතිය නොව, බලසම්පන්න, ප්‍රේමාන්විත, හික්මුණු ආත්මානුභාවය ය. එහෙයින් අපේ ස්වාමින් වහන්සේ උදෙසා සාක්ෂි දැරීම ගැනත්, මා උන් වහන්සේගේ සිරකරුවා වීම ගැනත්, ලජ්ජා නොවන්න. එහෙත් දෙවියන් වහන්සේගේ බලය කෙරෙහි විශ්වාසය තබා, සුබ අස්න වෙනුවෙන් දුක් විඳීමෙහි පංගුකාරයෙක් වන්න. ඔබ මාගෙන් ලබාගත් සාරගර්භ ධර්මයේ ආදර්ශය ක්‍රිස්තුස්

ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් හා ප්‍රේමයෙන් යුතු ව සිතෙහි නිදන් කර ගන්න. අපට භාර දුන් මේ අගනා දෙය අප තුළ වාසය කරන ශුද්ධාත්මයාණන්ගේ උපකාරයෙන් ආරක්ෂා කරන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** 1 සමුවෙල් 3:9; ජුවාම් 6:68

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණනි, කථා කළ මැනව. ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටියි.
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙත ය.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 17:5-10

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"අබ ඇටයක් පමණ ශ්‍රද්ධාව ඔබට ඇත්නම්"**

එවිට ශ්‍රාවකයෝ කතා කොට, "අපේ ශ්‍රද්ධාව වැඩි කළ මැනවැ"යි ස්වාමින් වහන්සේට කී හ. ස්වාමින් වහන්සේ කතා කොට, "අබ ඇටයක් පමණ ශ්‍රද්ධාව ඇති ව, මේ ඇඹිල්ල ගහට, 'ඉදිරී ගොස්, මුහුදේ පැලවෙව'යි කියන්නහු නම්, එය ඔබට කීකරු වනු ඇත. එහෙත්, ඔබ අතරෙන් යමෙකුට සීසාන හෝ බැටළුවන් බලන හෝ දාසයෙක් සිටී නම් කෙතේ සිට ආ කල, 'වහාම ඇවිත් කෑමට ඉඳ ගන්නැ'යි කියන්නෙහි ද? එසේ නොව, 'මට කෑම බීම පිළියෙළ කොට, ඇඳගෙන ලෑස්ති වී, කා බී නිම වන තුරු මට උපස්ථාන කරන්න; ඉන්පසු ඔබ කන්න බොන්නැ'යි කියන්නේ නැද් ද? ඒ දාසයා තමාට අණ කළ දේ කළ බැවින් ස්වාමියා ඔහුට ස්තුති කරයි ද? නැත. එසේ ම ඔබත් ඔබට අණ කළ සියල්ල කළ පසු, 'අපි දාසයෝ ය, ස්තුතියක් අපට හිමි නැත, කළ යුතු දෙය පමණක් අපි කෙළෙමු'යි කියන්නැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.